# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2008 අංක 9 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 පෙබරවාරි මස 29 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 18.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**2008 අංක 9 දරන දේශීය ආදායම්**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ : 2008 පෙබරවාරි මස 29 වන දින]

එල්. ඩී.— ඕ. 1/2008

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2008 අංක 9 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2006 අංක 10 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ (xvii) වන අනුඡේදයේ "සමුපකාර සමිතියක් ලබන ලාභ සහ ආදායම වන්නා වූ ද,", යන වචන වෙනුවට "2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් හෝ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන්, සමුපකාර සමිතියක් ලබන ලාභ සහ ආදායම වන්නා වූ ද," යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (උ) ඡේදයේ "ලාභ සහ ආදායම,", යන වචන වෙනුවට "ලාභ සහ ආදායම;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඌ) 2008 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන අවුරුදු පහක කාල පරිච්ඡේදය තුළ සෑම තක්සේරු වර්ෂයක් සඳහාම, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව වූ යම් ලියාපදිංචි සමිතියක ලාභ සහ ආදායම ;

2—PL 002798—6,150 (2008/02)

(එ) 2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල පනතින් පිහිටුවන ලද අපි වෙනුවෙන් අපි අරමුදලේ ලාභ සහ ආදායම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදයේ "ගෙවන නිල පඩිනඩි වලින් හරි අඩක් ;", යන වචන වෙනුවට "2008 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන ඕනෑම තක්සේරු වර්ෂයක් සඳහා ගෙවන නිල පඩිනඩි වලින් හරි අඩක් ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) ඡේදයේ "ශ්‍රී ලංකාවේදී ඇති වන පඩිනඩි", යන වචන වෙනුවට "2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර ශ්‍රී ලංකාවේදී ඇතිවන පඩිනඩි" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) පඩිනඩි ආදායම් බද්දෙන් නිදහස් කිරීම සඳහා විධිවිධාන සලස්වා ඇත්තා වූ ගිවිසුමකට ශ්‍රී ලංකා රජය සමග එළඹ ඇත්තා වූ ව්‍යවසායක් විසින් හෝ 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළකරන ලද යම් ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් විසින්, විශේෂඥයකු වන සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන හා ශ්‍රී ලංකාවෙහි සේවයෙහි නියුක්ත යම් පුද්ගලයකුගේ, ශ්‍රී ලංකාවේ දී උද්ගත වන පඩිනඩි හා ශ්‍රී ලංකාවේ දී උද්ගත නොවන යම් ආදායමක් ;

මේ ඡේදයේ කාර්යය සඳහා "විශේෂඥයකු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් අතර අවශ්‍ය විශේෂඥ දැනුම ඇති විශේෂඥයන් නොමැති ක්ෂේත්‍රයක් ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයකු අදහස් වේ ;";

(ඈ) (උ) ඡේදයේ "ඒ තැනැත්තාගේ භාර්යාවට හෝ", යන වචන වෙනුවට "ඒ තැනැත්තාගේ කලත්‍රයාට හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඉ) (ජ) ඡේදයේ—

(i) "සේවායෝජකයකු විසින් තමාගේ සේවයේ නියුක්ත කරනු ලැබ ඇති සියලුම සේවා නියුක්තිකයන්ට ඒකාකාරී ලෙස අදාළ වන", යන වචන වෙනුවට "සාධාරණ යයි සැලකිය හැකි" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) "මේ ඡේදයෙහි කිසියම් කොටසක් " යන වචනවල සිට "ඒ අතිරික්තය අදහස් වේ;" යන වචන දක්වා වූ සියලුම වචන ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යන දින දෙකින් වඩා කලින් එළඹෙන දිනය දක්වා,", යන වචන වෙනුවට "යන දින දෙකින් වඩා කලින් එළඹෙන, එහෙත් 2008 අප්‍රේල් මස 1 වන දිනට පසුව නොවන දිනයක් දක්වා," යන වචන ආදේශ කිරීමෙන්.

**4.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (උ) ඡේදයේ "1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටවුන ලද කිසියම් බැංකුවක ", යන වචන හා ඉලක්කම් වෙනුවට "1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ

පිහිටුවන ලද යම් බැංකුවක හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව වූ යම් ලියාපදිංචි සමිතියක" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඔ) ඡේදයෙහි "උපචිත වන පොලිය,", යන වචන වෙනුවට "උපචිත වන පොලිය; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (ඔ) ඡේදයට ඉකිබිතිවම පහත සඳහන් අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ඕ) විදේශ ව්‍යවහාර මුදල්වලින් වටිනාකම නියම කර ඇති සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් නිකුත් කරන ලද මාතෘභූමි සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමෙන් ශ්‍රී ලංකාවේ යම් නිර්වාසික පුරවැසියකුට ඇති වන හෝ උපචිත වන පොලිය හෝ වට්ටම; සහ

(ක) ශ්‍රී ලංකාවෙන් පිටත කරන ලද ආයෝජනයකින් 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවේ වාසික යම් තැනැත්තකුට උපචිත වන හෝ ඇතිවන යම් පොළියක්, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, එම පොළිය,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඒ) ශ්‍රී ලංකාවේ වාසික යම් කොටස් හිමියකුට ශ්‍රී ලංකාවේ නිර්වාසික සමාගමක් විසින් 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ගෙවන ලද යම් ලාභාංශයක්, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, එම ලාභාංශය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (අ) 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඉදිකිරීම සම්පූර්ණ කරනු ලැබූ යම් නිවසක් හුදෙක් වාසික කාර්යය සඳහා පමණක් භාවිත කරනු ලබන්නේ නම්, එම නිවස ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සඳහා සහ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතර සඳහා, එම නිවසේ අයිතිකරුට උපචිත වන ආදායම :

එසේ වුවද, එම නිවසේ බිම් ප්‍රමාණය වර්ග අඩි එක්දහස් පන්සියයක් හෝ ඊට අඩු වන අවස්ථාවක, එම නිවසේ ඉදිකිරීම් සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සඳහා සහ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හය සඳහා, එම නිවසේ අයිතිකරුට උපචිත වන ආදායම ; සහ

(ආ) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ඉදිකිරීම සම්පූර්ණ කරනු ලැබුවා වූ ද, නිවසේ බිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයක් හෝ ඊට අඩු වන්නා වූ ද යම් නිවසක් හුදෙක් වාසික කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලබන්නේ නම්, එම නිවස ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සඳහා සහ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතර සඳහා, එම නිවසේ අයිතිකරුට උපචිත වන ආදායම,

ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.".

**7.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "යම් තක්සේරු වර්ෂයකදී", යන වචන වෙනුවට "2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් තක්සේරු වර්ෂයක දී" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "විදේශීය ව්‍යවහාර මුදලින් උපයාගත් ලාභ සහ ආදායම් ද,", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා විදේශීය ව්‍යවහාර මුදලින් උපයාගත් ලාභ සහ ආදායම් ද," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ "විදේශීය ව්‍යාපාර මුදලින් උපයාගත් ලාභ සහ ආදායම්", යන වචන වෙනුවට "2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා විදේශීය ව්‍යවහාර මුදලින් උපයා ගත් ලාභ සහ ආදායම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (ඇඈ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇඈ) ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ යහපත උදෙසා යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් නිශ්චිතව දක්වනු ලබන යම් රක්ෂාවක් හෝ වෘත්තියක් මගින් කරනු ලබන යම් සේවාවක් ඉටු කිරීමේ දී, ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක්, වාසික පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ලබාදෙන සේවාවක් වෙනුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද යම් ලාභ සහ ආදායම් (කොමසාරිස් ජනරාල්වරයා විසින් සාධාරණ යයි සලකනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත දී වියදම් කරන ලද යම් වියදම් ඇත්නම්, ඒ වියදම් අඩු කිරීමෙන් පසු ඉතිරි වන) එකී ලාභ සහ ආදායම්, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබ ඇත්නම්;";

(5) ඒ වගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමන් :—

"(එඑ) ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබ, කපා ඔප දැමීමෙන් පසුව අපනයනය කරනු ලබන මැණික් වලින් උද්ගත වන, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම් ;";

(6) ඒ වගන්තියේ (බ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(බබ) 24ඇ වගන්තියේ සඳහන් යම් අලුත් ව්‍යවසායක් වෙනුවෙන්, ප්‍රදානය කරනු ලැබූ යම් ණය මුදලක මුළු මුදලම එකී ව්‍යවසායෙහි ආයෝජනය කර ඇත්නම්, එකී ණය මුදල වෙනුවෙන් ශ්‍රී ලංකාවේ යම් බැංකුවකට ගෙවිය යුතු පොළියට සමාන මුදලක් ;";

(7) ඒ වගන්තියේ (ම) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(මම) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට අත්‍යවශ්‍ය බවට අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ව්‍යාපෘතියක භාවිතය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් ආණ්ඩුවට, යම් රාජ්‍ය සංස්ථාවකට, යම් ආණ්ඩුවේ ආයතනයකට හෝ වෙනත් යම් ව්‍යවසායක් සඳහා 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු සපයන ලද යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් කරන ලද ගෙවීමකින්, එවැනි යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් උපයන ලද හෝ ඊට දේශක වන යම් ලාභ හෝ ආදායම ;" සහ

(8) ඒ වගන්තියේ (ය) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(යය) ශ්‍රී ලංකාවෙහි යම් ව්‍යවසායක සේවයේ නියුක්තව සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකුගේ, 2008 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වී එකී සේවා නියුක්තිය අවසන් වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත දී එම තැනැත්තා විසින් උපයනු ලැබූ හෝ එම තැනැත්තාට උද්ගත වූ ලාභ සහ ආදායම ;

(යයය) නාගරික සංවර්ධන අධිකාරිය හෝ ජාතික නිවාස අධිකාරිය විසින් අනුමත කරන ලද නිවාස යෝජනා ක්‍රමයක් යටතේ අඩු ආදායම්ලාභීන් සඳහා එක් එක් නිවාසයේ බිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයක් නොඉක්මවන යම් නිවාස ඉදිකිරීමෙහි නියැලී සිටින ව්‍යවසායක් විසින්, එකී නිවාස විකිණීම 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර සිදු කරන්නේ නම්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ එම ව්‍යවසායේ ලාභ සහ ආදායම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " එම ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට" යන වචනවල සිට එම උපවගන්තිය අවසානය දක්වා වූ වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එම ව්‍යවසාය යම් තක්සේරු වර්ෂයක දී එකී තක්සේරු වර්ෂයේ දී එළඹෙන ලද ගණුදෙනු වලින් ලාභ ලැබීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට යන තක්සේරු වර්ෂ දෙකින්, කලින් එළඹෙන වර්ෂයේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාල සීමාවක් සඳහා, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කළ කාලසීමාව 2008 මාර්තු මස 31 වන දිනෙන් පසුව, ආරම්භ වන අවස්ථාවක, එකී ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් වන කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතු ය.”.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ “අවුරුදු හයකට නොඅඩු එහෙත් අවුරුදු දොළහකට නොවැඩි කාල සීමාවකට,” යන වචන වෙනුවට “2009 මාර්තු මස 31 වන දිනට පසුව නොවන දිනක සිට ආරම්භ විය යුතු අවුරුදු හයකට නොඅඩු එහෙත් අවුරුදු දොළහකට නොවැඩි කාලසීමාවකට,” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (1) වන උපවගන්තියේ “ඒ සමාගම ලාභ ඉපයීම ආරම්භ කළ” යන වචනවල සිට එම උපවගන්තිය අවසාන දක්වා වූ වචන වෙනුවට, පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

“එම ව්‍යවසාය යම් තක්සේරු වර්ෂයක දී එකී තක්සේරු වර්ෂයේ දී එළඹෙන ලද ගණුදෙනුවලින් ලාභ ලැබීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාලයක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට යන තක්සේරු වර්ෂ දෙකින් කලින් එළඹෙන වර්ෂයේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාල සීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරන ලද කාලසීමාව 2008 අප්‍රේල් මස 01 වන දිනෙන් පසුව ආරම්භ වන අවස්ථාවක, එකී ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් වන කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතු ය.”.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (2) උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ “2008 අප්‍රේල් මස 1”, යන වචන හා ඉලක්කම් වෙනුවට “2009 අප්‍රේල් මස 1” යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියේ (ඉ) ඡේදයේ "2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර", යන වචන හා ඉලක්කම් වෙනුවට "2009 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "2008 මාර්තු 31 දිනට පසුව", යන වචන හා ඉලක්කම් වෙනුවට "2009 මාර්තු මස 31 වන දිනට පසුව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 21අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"සමහර දිස්ත්‍රික්ක වලින් නැවත ස්ථානගත කරන ලද ව්‍යවසායවල ලාභ සහ ආදායම නිදහස් කිරීම.

21අ. (1) (2) වන උපවගන්තියේ සඳහන් නැවත ස්ථානගත කරන ලද යම් ව්‍යවසායයකින්, යම් සමාගමකට ලැබෙන, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල (ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් ලබන්නා වූ යම් ලාභ සහ ආදායම් හැර) ලාභ සහ ආදායම් 2009 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන අවුරුදු පහක කාල පරිච්ඡේදයක් ඇතුළත සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා එකී වගන්තියේ සඳහන් යම් සමාගමකට සහ යම් තක්සේරු වර්ෂයකට අදාළව "නැවත ස්ථානගත කරන ලද යම් ව්‍යවසායයක්" යන්නෙන්—

(අ) 2007 නොවැම්බර් මස 1 වන දිනට පෙර කොළඹ හෝ ගම්පහ යන පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත එම සමාගම විසින් පවත්වාගෙන යනු ලැබුවා වූ ද, පුද්ගලයන් සියයකට නොඅඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්තව සිටින්නා වූ ද ;

(ආ) 2009 මාර්තු මස 31 වන දිනට ප්‍රථම කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කවලින් පිටත ස්ථානගත කරනු ලැබුවා වූ ද, 2009 මාර්තු මස 31 වන දිනට පසුව එළඹෙන දිනයක් නොවන යම් දිනයක ආරම්භ වී, එම තක්සේරු වර්ෂය පුරාම —

(i) වාණිජ කටයුතු සිදුකර ගෙන යනු ලබන ; සහ

(ii) 2007 නොවැම්බර් මස 1 වන දින සේවයේ නියුක්තව සිටි සේවක සංඛ්‍යාවට නොඅඩු සංඛ්‍යාවක් සේවයේ යොදවනු ලබන ;

(ඇ) නැවත ස්ථානගත කිරීමේ දී දැරීමට සිදු වූ වියදම රුපියල් මිලියන සියයකට නොඅඩු වන්නා වූ ද; සහ

(ඈ) මෙම පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ හෝ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග එළඹුනු ගිවිසුමක් යටතේ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල (ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් ලබන්නා වූ යම් ලාභ සහ ආදායම් හැර) ලාභ සහ ආදායම්, 2009 අප්‍රේල් මස 1 වන දිනයෙන් ඔබ්බට බලපැවැත්වෙන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වන්නා වූ,

ව්‍යවසායයක් අදහස් කෙරේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උප වගන්තියේ “ඒ ව්‍යවසාය ලාභ ඉපයීම ආරම්භ කරන තක්සේරු වර්ෂයේ ” යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“එම ව්‍යවසාය යම් තක්සේරු වර්ෂයක දී, එකී තක්සේරු වර්ෂයේ දී එළඹෙන ලද ගණුදෙනුවලින් ලාභ ලැබීම ආරම්භ

කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට යන තක්සේරු වර්ෂ දෙකින් කලින් එළඹෙන දින සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරන ලද කාලසීමාව 2008, අප්‍රේල් මස 1 වන දිනයෙන් පසුව ආරම්භ වන අවස්ථාවක, එකී ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් වන කාලසීමාව අවුරුදු තුනක් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ :—

(අ) “යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක”, යන වචන වෙනුවට “ මෙහි (අ), (ආ) සහ (ඇ) ඡේදයන්හි සඳහන් යම් ව්‍යාපෘතියක කරනු ලැබූ නිශ්චිත ආයෝජනවලින් යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන තවදුරටත් වූ අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :—

“එසේම තවදුරටත් අවදානම් ප්‍රාග්ධන සමාගම 2008 අප්‍රේල් මස 1 වන දිනෙන් පසුව වාණිජ කටයුතු ආරම්භ කරන අවස්ථාවක දී, ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් වන කාලසීමාව අවුරුදු තුනක් විය යුතු ය.”;

(2) එම වගන්තියේ (6) වන උපවගන්තියේ “අක්‍රිය” යන යෙදුම සහ “ඌන ක්‍රියාකාරිත්වය” යන යෙදුම සඳහා දී ඇති අර්ථ නිරූපණ ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තා ලාභ ඉපයීම" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ වචන වෙනුවට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :—

"ඒ තැනැත්තා ඒ ව්‍යාපාරයෙන් යම් තක්සේරු වර්ෂයක දී එකී තක්සේරු වර්ෂයේ දී එළඹුනු ගනුදෙනුවලින් ලාභ ලැබීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යාපාරය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට යන තක්සේරු වර්ෂ දෙකින් කලින් එළඹෙන වර්ෂයේ සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) 2003 අප්‍රේල් මස 1 වන දින සිට හෝ එදිනට පසුව ලංකා සංචාරක මණ්ඩලය සමග ලියාපදිංචි වූ යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන සංචාරකයන් සඳහා වලව් නිවාස හෝ විශේෂිත සංවර්ධිත බංගලාවල නවාතැන් පහසුකම් ලබාදීමේ ව්‍යාපාරයක් සඳහා, එසේ ලියාපදිංචි වීමේ දින සිට වසර දහයක කාලසීමාවක් වෙනුවෙන්, (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 24ඇ සහ 24ඈ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 24ඇ සහ 24ඈ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:—

"නැගෙනහිර පළාත තුළ ස්ථානගත අලුත් ව්‍යවසායන්හි ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

24ඇ. (1) (2) වන උපවගන්තියේ සඳහන් අලුත් ව්‍යවසායක් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව (යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන් ලැබෙන ලාභ හා ආදායම හැර) ලාභ සහ ආදායම්, යම් තක්සේරු වර්ෂයක දී එම තක්සේරු වර්ෂයේ දී

එළඹුනු ගණුදෙනුවලින් ලාභ ලැබීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට යන තක්සේරු වර්ෂ දෙකින් කලින් එළඹෙන වර්ෂයේ සිට වර්ෂ පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "අලුත් ව්‍යාපාරයක් " යන්නෙන් :—

(අ) 2007 නොවැම්බර් මස 7 වන දිනට පෙර පැවතියා වූ ව්‍යවසායක් වෙන් කිරීමෙන් ප්‍රතිනිර්මාණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් සකස් කරනු නොලැබුවා වූ ද;

(ආ) 2007 නොවැම්බර් මස 7 වන දින හෝ එදිනට පසුව වාණිජ කටයුතු ආරම්භ කරනු ලැබුවා වූ ද; සහ

(ඇ) නැගෙනහිර පළාත ඇතුළත පිහිටියා වූ ද,

2010 අප්‍රේල් මස 1 වන දිනට පෙර රුපියල් මිලියන තිහකට වඩා අඩු නොවන මුදල් (ඉඩම් සඳහා හැර) ස්වකීය ව්‍යවසායේ ආයෝජනය කරනු ලබන ව්‍යවසායක් අදහස් වේ.

යම් පසුගාමී කළාපයක පිහිටා ඇති යම් අලුත් ව්‍යවසායක ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

24ඈ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් පසුගාමී කළාපයක පිහිටා ඇති (යම් නිශ්චිත ව්‍යවසායක් නොවන) යම් අලුත් ව්‍යාවසායක (ප්‍රාග්ධන වත්කම් කිසිවක් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම් හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම, යම් තක්සේරු වර්ෂයක දී එකී තක්සේරු වර්ෂයේ දී එළඹුනු ගණුදෙනුවලින් ලාභ ලැබීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන වර්ෂ දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂය ට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ

ආරම්භයේ සිට, තක්සේරු වර්ෂ දෙකින් කලින් එළඹෙන වර්ෂයේ සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යයන් සඳහා—

යම් තක්සේරු වර්ෂයකට අදාළව "පසුගාමී කළාපය" යන්නෙන්, ඒ තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ තක්සේරු වර්ෂයේ ආර්ථික පසුබෑමේ තත්ත්වයක පැවති ලෙස යම් නිසි අධිකාරියක් විමසා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ නිශ්චිතව සඳහන් කරන ලද නියමයක් මගින් නිශ්චය කරන ලද යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් අදහස් වේ;

"අලුත් ව්‍යවසායක් " යන්නෙන් –

(අ) 2008 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසුව වාණිජ කටයුතු ආරම්භ කරන ; සහ

(ආ) 2010 මාර්තු මස 31 වන දිනට පෙරාතුව එහෙත් 2007 නොවැම්බර් මස 7 වන දිනට පසුව (ඉඩම් හැර) ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම උදෙසා ආයෝජනය කරන මුදල රුපියල් මිලියන තිහකට නොඅඩු වන්නා වූ,

ව්‍යවසායක් අදහස් වේ; සහ

"නිශ්චිත ව්‍යවසායක් "යන්නෙන්, එම ව්‍යවසාය මගින් නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සිදු නොකළ යම් භාණ්ඩයක් විකිණීමෙහි නිරත වන ව්‍යවසායක් අදහස් වේ.".

**18.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයේ අතුරු විධානයේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "සමාගමක් විසින් අයිතිකරගත් හෝ

කුලියට ගත් ", යන වචන වෙනුවට "සමාගමක් විසින් අයිතිකරගත් " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඔ) ඡේදයේ අතුරු විධානයේ (v) වන ඡේදයේ "ඉඩ දෙනු නොලැබිය යුතු ය ;" යන වචනවල සිට එම අතුරු විධානය අවසානය දක්වා වූ වචන වෙනුවට "ඉඩ දෙනු නොලැබිය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් .

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන වගන්තියේ," යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ වැඩිදුරටත් වූ අතුරු විධානයේ (ii) වන ඡේදයේ "ආදායම් උපදවීම සඳහා ප්‍රතියෝජනය කළහොත්,", යන වචන වෙනුවට "ආදායම් උපදවීම සඳහා එම ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් වූ එවැනි වත්කම් සඳහා ප්‍රතියෝජනය කළහොත්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ (vi) වන අනුඡේදයේ "එම තැනැත්තා විසින් එම වත්කම මත ගෙවන ලද කල්බදු වාරික හැර එම වත්කම බැහැර කිරීමෙන් ලැබෙන මුදල", යන වචන වෙනුවට "එම තැනැත්තා විසින් එම වත්කම බැහැර කිරීමෙන් ලැබෙන මුදලින්, එම වත්කම මත ගෙවන ලද කල්බදු වාරික හැර එම වත්කම අත්පත් කර ගැනීමේ වියදමක් වේ නම් එය අඩු කළ පසු, එම වත්කම බැහැර කිරීමෙන් ලැබෙන මුදල" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත සඳහන් අයුරින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ද) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"මේ උපවගන්තියේ (ඣ), (ත) සහ (ද) යන ඡේදවල කාර්ය සඳහා "සේවා නියුක්තයකු" යන යෙදුමට මේ පනතේ 131 වන වගන්තියේ එම යෙදුමට දී තිබෙන අර්ථයම තිබිය යුතු ය ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “25 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ”, යන වචන සහ ඉලක්කම් වෙනුවට “25 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**20.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ —

(අ) “යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායම ආරම්භ වන යම් වර්ෂයක් සඳහා-”, යන වචන වෙනුවට “යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායම් යනු එම තක්සේරු වර්ෂය සඳහා වූ-” යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ “අවස්ථාවෝචිත පරිදි 134 වන වගන්තිය යටතේ හෝ 135 වන වගන්තිය යටතේ ” යන වචන සහ ඉලක්කම් වෙනුවට “134 වන වගන්තිය යටතේ ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “පොලී ආදායම” යන යෙදුමේ අර්ථකථනයේ “මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ”, යන වචන සහ ඉලක්කම් වෙනුවට “මේ උපවගන්තියේ (ආ) ඡේදයේ ” යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

“(ඉ) යම් භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුමකින් ලබාගත් මුදලකින් මිල දී ගත් රුපියල් නාමික භාණ්ඩාගාර බැඳුම්කර විකිණීමෙන් එම තැනැත්තාට උපචිත වන ලාභ සහ ආදායම් ;

(ඊ) එම තැනැත්තා ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ඇප සහතික අරමුදල වන අවස්ථාවක දී, (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බැඳුම්කරවලින් හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත්කරන ලද යම් භාණ්ඩාගාර බිල්පතකින් හෝ එම අරමුදලට උපචිත වන පොළිය;

(උ) ශ්‍රී ලංකාවේ යම් සමාගමක් විසින් හෝ එය වෙනුවෙන් 135 වන වගන්තියේ අර්ථානුකූලව නිකුත් කරන ලද සහ ශ්‍රී ලංකාවට රැගෙන එනු ලැබ මිලදී ගැනීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික මුදල්වලට පරිවර්තනය කරනු ලැබූ විදේශීය ව්‍යවහාර මුදල්වලින් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් මිලදී ගනු ලැබූ යම් සාංගමික ණය සුරැකුම්පත් මත, ශ්‍රී ලංකාවෙන් පිටත දී එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරයට උපචිත වන්නා වූ ද, 95 වන වගන්තිය යටතේ ආදායම් බද්ද අඩු කර ගනු ලැබුවා වූ ද පොළිය; සහ

(ඌ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් මේ පනතේ 161අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බදු අඩු කර ගනු ලැබූ යම් මැණික් විකිණීමකින් ලබන ලාභ සහ ආදායම්.";

(4) එම වගන්තියේ (5) වන උපවගන්තියේ —

(අ) (අ) ඡේදයේ "වශයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා එම තැනැත්තා විසින් ගෙවනු ලබන මුදල්", යන වචන වෙනුවට "වශයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා එම තැනැත්තා විසින් ගෙවනු ලබන මුදල්. " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ආ) ඡේදයෙහි "(ඇ) ඡේදයේ සඳහන් කරන ලද නඩුවක" , යන වචන වෙනුවට "(ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ සඳහන් කරන ලද නඩුවක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (ඇ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු යම් මූල්‍ය කල්බදු ව්‍යාපාරයකින් ලැබූ යම් අලාභයක් සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් කර ඇති එම ව්‍යාපාරයෙන් ලැබූ ලාභවල ප්‍රමාණය නොඉක්මවන පරිදි අඩු කිරීමෙන් පසු, එම පාඩුවේ යම් ඉතිරි මුදලක් ඇත්නම් එම ඉතිරි මුදල, එම තක්සේරු වර්ෂයට පසුව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා වූ පාඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය;";

(5) එම වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ "23 වන වගන්තිය හෝ 24 වන වගන්තිය", යන වචන සහ ඉලක්කම් වෙනුවට "23 වන වගන්තිය හෝ 24 වන වගන්තිය හෝ 24අ වගන්තිය හෝ 24ආ වගන්තිය හෝ 24ඇ වගන්තිය හෝ 24ඈ වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(6) එම වගන්තියේ (7) වන උපවගන්තියේ "අත්වන අලාභයක මුදල් ප්‍රමාණය මේ පනතෙහි වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් අත්වන අලාභයක මුදල් ප්‍රමාණය මේ පනතෙහි" යන වචන වෙනුවට "අත්වන අලාභයක මුදල් ප්‍රමාණය මේ පනතෙහි" යන වචන ආදේශ ආදේශ කිරීමෙන්.

**21.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) (ආ) ඡේදයේ (viii) වන අනුඡේදයේ අවසානයට පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :—

"(ix) 2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනත මගින් පිහිටුවන ලද අපි වෙනුවෙන් අපි අරමුදලට,";

(ආ) (උෟ) ඡේදයේ "(උෟ) රුපියල් මිලියන පනහකට" යන වචනවල සිට "දරන ලද වියදම් :" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"(උෟ) (i) 2007 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිෂ්පාදනය අවසන් කරනු ලැබුවා වූ ද, නිෂ්පාදන වියදම රුපියල් මිලියන පහකට නොඅඩු පිරිවැයක් සහිත වූ ද, යම් චිත්‍රපටියක් නිෂ්පාදනය කිරීම සඳහා යම් තැනැත්තකු විසින් දරන ලද වියදම ; හෝ

(ii) 2007 අප්‍රේල් මස 1 වන දිනට පසු නිෂ්පාදනය අවසන් කරනු ලැබුවා වූ ද, නිෂ්පාදන වියදම රුපියල් මිලියන පහකට නොඅඩු පිරිවැයක් සහිත වූ ද, යම් චිත්‍රපටියක් නිෂ්පාදනය කිරීම සඳහා යම් තැනැත්තකු විසින් දරන ලද වියදම :";

(ඇ) (ක) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:—

"(ග) (i) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව සිනමාරූපී චිත්‍රපටි ප්‍රදර්ශනය කිරීම ආරම්භ කර ඇත්තා වූ ද; සහ

(ii) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථාව විසින් ඩිජිටල් තාක්ෂණය, ඩිජිටල් ප්‍රදර්ශන ක්‍රම සහ ඩොල්බි ශබ්ද පද්ධතිවලින් සමන්විත බවට සහතික කරනු ලැබුවා වූ ද,

සිනමා ශාලාවක් ඉදිකිරීමේ දී සහ ඊට උපකරණ සැපයීමේ දී දරන ලද රුපියල් මිලියන විසිපහකට නොවැඩි වියදමක් ;

(ච) (i) 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර සිනමාරූපී චිත්‍රපටි ප්‍රදර්ශනය කිරීම ආරම්භ කර ඇත්තා වූ ද ;

(ii) 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඩිජිටල් තාක්ෂණයේ, ඩිජිටල් ප්‍රදර්ශන ක්‍රම සහ ඩොල්බි ශබ්ද පද්ධතිවලින් සමන්විත නොවූ ද; සහ

(iii) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථාව විසින් 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ඩිජිටල් තාක්ෂණය, ඩිජිටල් ප්‍රදර්ශන ක්‍රම සහ ඩොල්බි ශබ්ද පද්ධතිවලින් සමන්විත බවට සහතික කරනු ලැබුවා වූ ද,

සිනමා ශාලාවක්, තත්ත්වය වැඩිදියුණු කිරීමේ දී දරන ලද වියදම රුපියල් මිලියන දහයකට නොවැඩි වියදමක් ;

(ජ) 21අ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් නැවත ස්ථානගත කරන ලද ව්‍යවසායක්, නැවත ස්ථානගත කිරීමේ දී යම් සමාගමක් විසින් දරන ලද වියදමක් ; සහ

(ට) යම් තැනැත්තකු විසින් 13 වන වගන්තියේ (යයය) ඡේදයේ සඳහන් යම් ව්‍යවසායක ආයෝජනය කරන ලද යම් මුදලක්.";

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ —

(අ) (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ "(එ), (ඒ) සහ (ඔ) යන ඡේදවල ", යන වචන වෙනුවට " (එ), (ඒ), (ඔ), (ග), (ච) සහ (ට) යන ඡේදවල", යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (අ) ඡේදයේ (iii) (ආ) අනුඡේදයේ "රුපියල් මිලියන විසිපහක් " යන වචන වෙනුවට "රුපියල් මිලියන තිස්පහක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (අ) ඡේදයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන් :—

"(vii) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද (2) වන උපවගන්තියේ (ග) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන්, රුපියල් මිලියන විසිපහක් නොඉක්මවිය යුතු ය ;

(viii) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් සිදුකරන ලද (2) වන උපවගන්තියේ (ච) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන්, රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය;

(ඈ) (ආ) ඡේදයේ (i) අනුඡේදයේ, "(ඔ), (ඕ) සහ (ක) අනුඡේදවල", යන වචන වෙනුවට "(ඔ), (ඕ), (ක), (ග), (ච) සහ (ට) යන අනුඡේදවල" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) (ආ) ඡේදයේ (ii) (ආ) අනුඡේදයේ "රුපියල් මිලියන විසිපහක් ", යන වචන වෙනුවට "රුපියල් මිලියන තිස්පහක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) (ආ) ඡේදයේ (iv) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන් :—

"(v) යම් සමාගමක් විසින් කරන ලද (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් වන විට දී, එය එහි තක්සේරු කළ හැකි ආදායමෙන් පහෙන් එකක් හෝ රුපියල් ලක්ෂ පහක් යන මෙයින් අඩු මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය;

(vi) ඒ සමාගම විසින් එම තක්සේරු වර්ෂයෙහි කරන ලද (2) වන උපවගන්තියේ (ග) ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් වන විට දී, රුපියල් මිලියන විසිපහක් නොඉක්මවිය යුතු ය;

(vii) ඒ සමාගම විසින් එම තක්සේරු වර්ෂයේ දී කරන ලද (2) වන උපවගන්තියේ (ච) ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් වන විට දී, රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය.";

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියෙහි "(ඇ), (ඕ) හෝ (ක) ඡේදයන්හි ", යන වචන වෙනුවට, "(ඇ), (ඌ)(ii), (ඕ), (ක), (ග), (ච) හෝ (ට) ඡේදයන්හි" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එම වගන්තියේ (6) වන උපවගන්තියේ "(2) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ සඳහන් " යන වචන වෙනුවට "(2) වන උපවගන්තියේ (ඌ) (i) ඡේදයේ සඳහන්" යන වචන ආදේශ කිරීමෙන් ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ "පළමුවන උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව", යන වචන වෙනුවට "පළමුවන උපලේඛනයේ V කොටසේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව" යන වචන ආදේශ කිරීමන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 40අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" ගුවන් නියමුවන්ගේ සේවා ආදායම මත උපරිම බදු අනුප්‍රමාණය.

40අ. (365 වන අධිකාරය වූ) ගුවන් සංතරණ පනත යටතේ බලපත්‍රලත් ගුවන් සමාගමක ගුවන් නියමුවකු වශයෙන් සේවයෙහි නියුතු යම් ශ්‍රී ලාංකික පුරවැසියකුගේ, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන බදු අයකළ හැකි ආදායමෙහි, එකී සේවා නියුක්තියෙන් ලබන ලාභයෙන් සමන්විත වන කොටස, මෙම පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මෙම පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණයට ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු නමුත්, එසේ ආදායම් බද්ද අය කරන අනුප්‍රමාණය කිසිම අවස්ථාවක දී සියයට 20 ක් නොඉක්මවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පරිච්ඡේදයේ වෙනත් විධිවිධානවල හෝ X පරිච්ඡේදයේ හෝ යම් විධිවිධානයක පටහැනිව", යන වචන සහ ඉලක්කම වෙනුවට "මේ පනතේ 16 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, වෙනත් විධිවිධානවල පටහැනිව" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" බදු වලින් නිදහස් කාලය ඉකුත් වූ පසුව එළඹෙන කාලසීමාවන් සඳහා ආදායම් අනුප්‍රමාණ.

48. (1) (අ) 17, 18 හෝ 19 වන වගන්තිවල සඳහන් යම් නිශ්චිත ව්‍යවසායකින්;

(ආ) 20, 22, 24ඇ සහ 24ඈ වගන්තිවල සඳහන් යම් අලුත් ව්‍යවසායකින් ;

(ඇ) 21 සහ 21අ වගන්තිවල සඳහන් නැවත ස්ථානගත කරන ලද යම් ව්‍යවසායකින් ;

(ඈ) 23 වන වගන්තියේ සඳහන් යම් අවදානම් ප්‍රාග්ධන සමාගමකින් ;

(ඉ) 24 වන වගන්තියේ සඳහන් යම් ව්‍යාපාරයකින් ;

(ඊ) 24අ වගන්තියේ සඳහන් අලුත් හෝ වැඩි දියුණු කළ සිනමා ශාලාවකින්; හෝ

(උ) 24ආ වන වගන්තියේ සඳහන් නැවත විවෘත කරන ලද අත්හැර දමා තිබූ කර්මාන්ත ශාලාවකින්,

ඇතිවන යම් ලාභ සහ ආදායම්වලින් (2) වන උපවගන්තියේ සඳහන් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමේ යම් කොටසක් සංයුක්ත වන්නේ නම්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, ඒ තක්සේරු වර්ෂය සඳහා අදාළ කරගත හැකි එම උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණ අනුව, ආදායම් බදු අය කළ යුතු ය.

(2) (අ) (මෙහි මින් මතු "පළමු පශ්චාත් නිදහස් කිරීමේ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු

වර්ෂයක් වන්නා වූ ද, ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කර ඇති කාලසීමාවක් වන්නා වූ ද කාලය අවසාන වීමෙන් ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂයක් සඳහා, අදාළ කරගත යුතු බදු අනුප්‍රමාණය වනුයේ සියයට පහකි ;

(ආ) (මෙහි මින් මතු "දෙවන පශ්චාත් නිදහස් කිරීමේ වර්ෂය" යනුවෙන් මෙහි සඳහන් කරනු ලබන) පළමු පශ්චාත් නිදහස් කිරීමේ වර්ෂය අවසාන වීමෙන් ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂය සඳහා අදාළ කරගත යුතු බදු අනුප්‍රමාණය සියයට දහයක් විය යුතු ය ; සහ

(ඇ) දෙවන පශ්චාත් නිදහස් කිරීමේ වර්ෂය අවසන් වීමෙන් ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය සඳහා අදාළ කර ගත යුතු බදු අනුප්‍රමාණය සියයට පහළොවක් විය යුතු ය.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "සියයට පහළොවක් විය යුතු ය", යන වචන වෙනුවට "2008 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, සියයට දහයක් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ "10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සඳහන් ", යන වචන හා ඉලක්කම් වෙනුවට "10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම ඡේදයේ (ii) අනුඡේදයේ "එම පෙරාතුවම වූ වර්ෂය සඳහා බෙදා හැරිය හැකි ලාභයෙන් සියයට විසිපහකට

වඩා අඩු ලාභාංශ ප්‍රමාණයක් බෙදා හැර ඇති අවස්ථාවක, එම පෙරාතුවම වූ වර්ෂය සඳහා එම සමාගමේ බෙදා හැරිය හැකි", යන වචන වෙනුවට "එම පෙරාතුවම වූ වර්ෂය සඳහා බෙදා හැරිය හැකි ලාභයෙන් එකී පෙරාතුව ම වූ වර්ෂය ආරම්භ වී මාස දහඅටක කාලයක් ඇතුළත සියයට විසිපහකට වඩා අඩු ලාභාංශ ප්‍රමාණයක් බෙදා හැර ඇති අවස්ථාවක දී, එම පෙරාතුව ම වූ වර්ෂය සඳහා එම සමාගමේ බෙදාහැරිය හැකි" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම ඡේදයේ "අදාළ කොටස " යන යෙදුම සඳහා යොදා ඇති අර්ථ නිරූපණයේ —

(අ) (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) 7 වන වගන්තියේ (උෟ) ඡේදයේ සඳහන් යම් ලියාපදිංචි සමිතියක් වෙත එම ඡේදයේ සඳහන් කාලය ඇතුළත;";

(ආ) (ඈ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඉ) යම් ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් වෙත ;

(ඊ) 2008 අංක 6 දරන "අපි වෙනුවෙන් අපි" අරමුදල් පනත මගින් පිහිටුවන ලද "අපි වෙනුවෙන් අපි" අරමුදල වෙත, ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) වාසික සමාගමක් විසින් එම නිර්වාසික සමාගමට ගෙවනු ලැබූ ලාභාංශයක් ඇතුළත් නොවන්නා වූ, සමාගමේ ආදායම් බද්දට යටත් වන්නා වූ ලාභ සහ ආදායම්වලින් පිටරටට ප්‍රේෂණය කරන ලද හෝ පිටරට රඳවා ගනු

ලැබූ මුදල් සහ එම සමාගම විසින් ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලබන්නා වූ ද, ලබන ලාභ ශ්‍රී ලංකාවේ දී ආදායම් බද්දට යටත් වන්නා වූ ද, ශ්‍රී ලංකාවේ දී කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට අදාළව එම සමාගම විසින් හෝ එය වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී ලබාගත් යම් මුදලක් ;".

**30.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) 2008 අංක 6 දරන "අපි වෙනුවෙන් අපි" අරමුදල් පනත මගින් ස්ථාපිත අපි වෙනුවෙන් අපි අරමුදල් ;

(ඈ) ඒ ඡේදයේ දැක්වෙන කාල පරිච්ඡේදය තුළ 7 වන වගන්තියේ (ඌ) ඡේදයේ දැක්වෙන යම් ලියාපදිංචි සමිතියක් ;

(ඉ) ඒ වගන්තියේ දැක්වෙන පරිදි යම් පුද්ගලයකු ලබන යම් ලාභාංශයක් සම්බන්ධයෙන් 10 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කොට ඇති යම් තැනැත්තකු ;";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(4) 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ යම් වාසික සමාගමක් විසින් ගෙවිය යුතු බද්දට වඩා වැඩියෙන්, (1) වන උපවගන්තිය යටතේ යම් වාසික සමාගමක් විසින් සිදු කරනු ලැබූ අඩුකිරීම්වල එකතුව, ඒ (1) වන උපවගන්තියේ දැක්වෙන දළ ලාභාංශ ඒ සමාගමේ කොටස් හිමියන්ට ගෙවනු ලබන දින සිට දින තිහක කාලපරිච්ඡේදයක් තුළ දී, කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ (7) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය,", යන වචන වෙනුවට "නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය:"; සහ

(2) ඒ උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන තවදුරටත් වූ අතුරු විධානය එකතු කිරීමෙන් :—

"එසේම වැඩිදුරටත්, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, මේ උපවගන්තියේ විධිවිධාන යටතේ කිසිදු පුද්ගලයකු නිර්වාසිකයකු ලෙස සලකනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ අතුරු විධානයේ (අ) ඡේදයේ "හෝ ගෙවිය යුතු වන්නේ ය.", යන වචන වෙනුවට "හෝ ගෙවිය යුතු වන්නේ ය; " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ අතුරු විධානයේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(අඅ) 32 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (උ) ඡේදයේ දැක්වෙන යම් සංස්ථාපිත ණය සුරැකුම් මත වන 2008 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ගෙවනු ලබන හෝ බැර කරනු ලබන පොළියෙන් මේ වගන්තිය යටතේ බදු අඩු කර ගැනීම, මෙම පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, සියයට දහයක අනුප්‍රමාණයකට අනුව විය යුතු ය ; සහ".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "බදු මුදල අඩු කිරීම හෝ ප්‍රේෂණය කිරීම", යන වචන වෙනුවට "බදු මුදල අඩු කිරීම හෝ ඉවත් කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තාට ලියවිල්ලකින් නියම කරනු" යන වචන වෙනුවට "(1) වන උපවගන්තියේ සඳහන් ආශ්‍රිත ව්‍යවසාය එකක් හෝ අනෙකක් හෝ ව්‍යවසාය දෙකම පවත්වාගෙන යනු ලබන තැනැත්තාට ලියවිල්ලකින් නියම කරනු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු වාර්ෂික පිරිවැටුමක් සහිත හෝ වර්ෂයකට රුපියල් මිලියන එක් සියයකට නොඅඩු ශුද්ධ ලාභයක් සහිත වෙනත් යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ දැන්වීමක් ඒ නිල ලැයිස්තුගත පොදු සමාගම හෝ වෙනත් යම් සමාගම වෙත දෙනු නොලැබුව ද, ඒ නිල ලැයිස්තුගත පොදු සමාගම හෝ වෙනත් යම් සමාගම විසින් එම තක්සේරු වර්ෂයක් සඳහා නැතහොත් ව්‍යවස්ථාපිත ආදායම ආගනනය කරනු ලබන්නේ වෙනත් යම් කාලසීමාවක් සඳහා ද, ඒ කාලසීමාව සඳහා, ගැසට් පත්‍රයේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ප්‍රකාශ සහ යම් උපලේඛන ඉදිරිපත් කළ යුතු ය.";

(2) (2) වන උපවගන්තියේ අතුරුවිධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරුවිධානය ආදේශ කිරීමෙන් :—

"එසේම යම් තක්සේරු වර්ෂයක් සඳහා නැතහොත් ලාභය මත ව්‍යවස්ථාපිත ආදායම ආගනනය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද, ඒ කාලසීමාව සඳහා වූ ආදායම් වර්තාවක් සනාථ කිරීමෙහි ලා—

(අ) යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් එකී සමාගම විසින් කරගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් සපයනු ලබන ;

(ආ) වෙනත් යම් සමාගමක් විසින් එකී සමාගම විසින් කරගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් එම තක්සේරු වර්ෂය සඳහා හෝ එම වෙනත් යම් කාලසීමාව සඳහා ලබන පිරිවැටුම රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු හෝ එම තක්සේරු වර්ෂය හෝ එම වෙනත් කාලසීමාව සඳහා එම වෙළඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ව්‍යවස්ථාපිත ආදායම රුපියල් මිලියන සියයකට නොඅඩු වන්නේ නම්, එකී යම් සමාගමක් විසින් සපයනු ලබන ;

(ඇ) යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් නොවන යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන වෙළඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පිරිවැටුම ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ වෙනත් යම් කාලසීමාවක් සඳහා රුපියල් මිලියන පනහකට නොඅඩු හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය හෝ ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම රුපියල් මිලියන විසිපහකට නොඅඩු අවස්ථාවක, ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ කාලසීමාව සඳහා, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු හෝ සමාගමක් නොවන්නා වූ තැනැත්තකු විසින් සපයනු ලැබූ,

ගිණුම් ප්‍රකාශයක්, අනුමත ගණකාධිකාරිවරයකු විසින් ක්‍රියාත්මක කරන ලද විගණනයක පදනම මත පිළියෙල කරනු ලැබිය යුතු ය.”.

**36.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රදාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය “තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ මැයි මස පහළොස්වන දින හෝ එදිනට පෙර,”, යන වචන වෙනුවට "ඒ තක්සේරු වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන දින හෝ එදිනට පෙර,” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තියේ “සේවා යෝජකයා” යන අර්ථ නිරූපණයේ “යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් ”, යන වචන වෙනුවට ඒ වචන යෙදෙන සෑම තැනකම “යම් පුද්ගල මණ්ඩලයක් හෝ XV වන පරිච්ඡේදයේ සඳහන් ආණ්ඩුවේ ආයතන හැර, යම් සංවිධානයක් ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තිය සංශෝධනය කිරීම.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ XV වන පරිච්ඡේදයේ ශීර්ෂය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :—

“ආණ්ඩුවේ ආයතනයක් විසින් ආදායම් බදු ගෙවීමට අදාළ විධිවිධාන සහ යම් රජයේ ආයතනයක යම් සේවා නියුක්තිකයකුගේ නිල පාරිශ්‍රමික මත වන බද්දෙන් අඩු කිරීම. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ XVවන පරිච්ඡේදයෙහි ශීර්ෂය සංශෝධනය කිරීම.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි :—

(අ) “යම් තක්සේරු වර්ෂයක් සඳහා”, යන වචන වෙනුවට “2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු විධානය ඉවත් කොට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද, එසේ ගෙවන ලද ආදායම් බද්ද මුලුමනින් ම හෝ ඉන් කොටසක් එම සේවා නියුක්තිකයාට ආපසු ගෙවීම හෝ එම සේවා නියුක්තිකයා විසින් එම වෙනත් ආදායම් මත එම තක්සේරු වර්ෂයට ගෙවිය යුතු ආදායම් බද්දකට හිලව් කිරීම හෝ නොකළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "සඳහන් වුව ද, ආණ්ඩුවේ ආයතනයක්", යන වචන වෙනුවට "සඳහන් වුව ද, (1) වන උපවගන්තියේ සඳහන් පරිදි ආණ්ඩුවේ ආයතනයක් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙහි "ආණ්ඩුවේ ආයතනය" යන අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 132අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 132අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"ආණ්ඩුවේ ආයතනයක සේවා නියුක්තිකයකුගේ නිල පඩිනඩිවලින් ආදායම් බදු අඩු කිරීම.

132අ. (1) යම් ආණ්ඩුවේ ආයතනයක සේවා නියුක්තිකයකුගේ 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කළ හැකි ආදායමට නිල පඩිනඩි ඇතුළත් වන්නේ නම්, එම සේවා නියුක්තිකයා විසින් එකී තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන්, (2) වන උපවගන්තියේ සඳහන් ප්‍රමාණයක් අඩුකළ යුතු ය.

(2) කළ යුතු අඩු කිරීම වනුයේ, එම තක්සේරු වර්ෂය සඳහා (1) වන උපවගන්තියේ සඳහන්, සේවා නියුක්තිකයාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි ඇතුළත් වන්නා වූ (යම් විශ්‍රාම වැටුපක්, ප්‍රසාද දීමනා, දිරි දීමනා ගෙවීම්, ත්‍යාග මුදල්, දඩ මුදල්වල කොටසක් හෝ වෙනත් සමාන ගෙවීම් හැර) නිල පඩිනඩි, එකී මුළු ව්‍යවස්ථාපිත ආදායමට දරන අනුපාතයම, කිසියම්

මුදලක් ඒ තක්සේරු සඳහා එම සේවා නියුක්තිකයා විසින් ගෙවිය යුතු මුළු ආදායම් බද්දට දරයි ද, ඒ මුදලයි.

(1) වන සහ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා නිල පඩිනඩි යන්නට, ලබාදෙන සේවය සඳහා ලැබෙන 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දැක්වෙන සේවා නියුක්තියකින් ලැබෙන ලාභ අදහස් වේ.

(3) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "ආණ්ඩුවේ ආයතන" යන්නෙන් 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ධුර දරන පුද්ගලයින් සේවාවෙහි යොදවන්නා වූ යම් ආයතනයක් හෝ තැනැත්තෙක් අදහස් වේ.".

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) (අ) ඡේදයෙහි—

(i) (ii) වන අනුඡේදයේ "ඒකාබද්ධ අරමුදල ; හෝ ", යන වචන වෙනුට "ඒකාබද්ධ අරමුදල ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් අනුඡේද එකතු කිරීමෙන් :—

"(iv) 7 වන වගන්තියේ (උෟ) ඡේදයේ සඳහන් යම් ලියාපදිංචි සමිතියකට ඒ සමිතිය වෙනුවෙන් ඒ ඡේදයේ සඳහන් කාලපරිච්ඡේදය තුළ ගෙවනු ලබන පොළිය ; හෝ

(v) 2008 අංක 6 දරන "අපි වෙනුවෙන් අපි" පනත යටතේ පිහිටුවන ලද අපි වෙනුවෙන් අපි අරමුදල ; ";

(ආ) (ඇ) ඡේදයේ "හෝ 96 වන වගන්තිය", යන වචන සහ ඉලක්කම් වෙනුවට "හෝ 95 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "මේ වගන්තිය යටතේ ", යන වචන වෙනුවට "මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "ගෙවිය යුතු යම් පොළියක් ", යන වචන වෙනුවට "ගෙවිය යුතු (1) වන උපවගන්තියේ සඳහන් පොළිය හෝ (2) වන උපවගන්තියේ සඳහන් වැඩි වන ප්‍රමාණය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ :—

(අ) "හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලබන පොළියකින් (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව", යන වචන වෙනුවට "හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලබන පොළියකින් (1) වන උපවගන්තියට අනුකූලව හෝ වැඩිවන ප්‍රමාණය මත (2) වන උපවගන්තියට අනුකූලව" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (අ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් "පොළිය" යන වචනය වෙනුවට "පොළිය හෝ අතිරික්තය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(5) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ "පොළිය" යන වචනය වෙනුවට, එය සඳහන් වන සෑම අවස්ථාවක දී ම "පොළිය හෝ වැඩිවන ප්‍රමාණය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 152 වන වගන්තිය ඉවත් කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 152 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය සංශෝධනය කිරීම.

**43.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය තවදුරටත් පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරුවිධානයට ඉක්බිතිවම පහත දැක්වෙන තවදුරටත් වූ අතුරුවිධානය එකතු කිරීමෙන් :—

"එසේම තවදුරටත්, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු

පනත යටතේ ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක දී, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතු නිශ්චිත ගාස්තු සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධානයන් බලනොපෑයුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් විධානය කළ යුතු ය.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “නිශ්චිත ගාස්තු” යන යෙදුමේ අර්ථ නිරූපණයේ “පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන්”, යන වචන වෙනුවට “නිවාසයක් නොවන අන්‍යාකාරයකින් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන්” යන වචන ආදේශ කිරීමෙන්.

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 155 වන වගන්තියේ “බදු අඩුකර ගත යුතු ය.”, යන වචන වෙනුවට පහත සඳහන් වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 155 වන වගන්තිය සංශෝධනය කිරීම.

“බදු අඩුකර ගත යුතු ය :

එසේ වුව ද, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත යටතේ ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතු යම් කුලියක්, බදු කුලියක් හෝ වෙනත් ගෙවීමක් සම්බන්ධයෙන්, මෙම වගන්තියේ විධිවිධානයන් බලනොපෑයුතු බවට කොමසාරිස් ජනාරාල්වරයා විසින් විධානය කළ යුතු ය.”.

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 156 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 156 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “එසේ අඩුකර ගන්නා ආදායම් බදු සඳහා බැර, එම කුලී ගෙවීමට”, යන වචන

වෙනුවට "එසේ අඩුකර ගන්නා ආදායම් බදු සඳහා බැර, විධාන නිකුත් කිරීම, එම කුලී ගෙවීමට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

"(3) මෙම පරිච්ඡේදය යටතේ යම් කුලියකින්, බදු කුලියකින් හෝ වෙනත් ගෙවීමකින් ආදායම් බදු අඩුකිරීමට යටත් වන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක්, එම අඩුකිරීමට දින තිහකට පෙර කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලියාපදිංචි අංකයක් ලබා ගැනීමට අයදුම් කළ යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින් මසකට වරක් කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ ලියාපදිංචි නොවන හෝ (3) වන උපවගන්තියේ නියම කර ඇති පරිදි කිසියම් වාර්තාවක් ඉදිරිපත් නොකරන කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලැබිය හැකි රුපියල් පනස්දහසකට නොවැඩි දණ්ඩනයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම.

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තියේ අතුරු විධානයට ඉක්බිතිවම පහත දැක්වෙන තවදුරටත් වූ අතුරු විධානය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද, තවදුරටත්, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත යටතේ, ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක දී, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතු යම් වාර්ෂිකයක්, රාජ්‍ය භාගයක් හෝ කළමනාකරණ ගාස්තුවක් සම්බන්ධයෙන්, මෙම වගන්තියේ විධිවිධානයන් බලනොපැයුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් විධාන කළ යුතු ය.".

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ XX පරිච්ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ XXඅ පරිච්ඡේදය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට XXඅ අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.

"XX අ පරිච්ඡේදය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් පවත්වනු ලබන වෙන්දේසියක දී විකුණන ලද මැණික්වල විකුණුම් මිලෙන් ආදායම් බදු අඩු කිරීම.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යම් වෙන්දේසියක දී විකුණන ලද මැණික්වල විකුණුම් මිලෙන් ආදායම් බදු අඩු කිරීම.

161අ. (1) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් පවත්වන ලද වෙන්දේසියක දී විකුණනු ලබන මැණික්වල විකුණුම් මිලෙන් සියයට 2.5 ක අනුප්‍රමාණයකට ආදායම් බද්දක්, විකුණුම්කරුට ගෙවිය යුතු ප්‍රමාණයෙන් විකුණුම්කරුට ගෙවීම කරන අවස්ථාවේ දී, අඩුකළ යුතු ය.

(2) බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවන ලද පොළියෙන් ආදායම් බදු අඩුකිරීම, බැංකු සහ මූල්‍ය ආයතනවල කාර්යය, ආදායම් බදු අඩුකිරීමේ දී පැහැර හැරීම, බැංකු සහ මූල්‍ය ආයතන මත තක්සේරු නිකුත් කිරීම, අභියාචන සහ පැහැර හැරීම් සඳහා දණ්ඩන යන විෂයයන්ට අදාළ XVI වන පරිච්ඡේදයේ විධිවිධාන, විකුණුම් මිලෙන් ආදායම් බදු අඩුකිරීම හා ඊට අදාළව, එම විකිණීම කරනු ලබන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කාර්යය, ආදායම් බදු අඩුකිරීමේ දී පැහැර හැරීම, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මත තක්සේරු නිකුත් කිරීම, අභියාචන සහ මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම සඳහා දණ්ඩණය යන විෂයයන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව XVI පරිච්ඡේදයේ "බැංකු සහ මූල්‍ය ආයතන" යන වචන වෙනුවට "ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය" සහ "පොළිය" යන වචන වෙනුවට "විකුණනු ලැබූ මැණික්වල විකුණුම් මිල" යන වචන, ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය සංශෝධනය කිරීම.

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ "ඒ දායක මුදලින් සියයට පහලොවකට සමාන මුදලක්", යන වචන වෙනුවට "ඒ දායක මුදලින් සියයට දහයකට සමාන මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "සියයට පහලොවක්", යන වචන වෙනුවට "සියයට දහයක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

**49.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "නොවැම්බර්", යන වචනය යෙදී ඇති සෑම තැනම, ඒ වෙනුවට "සැප්තැම්බර්" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "වංචාවක්, මගහැරීමක්, හිතාමතා පැහැරහැරීමක් සිදුකර ඇති බවට", යන වචන වෙනුවට "වංචාවක්, මගහැරීමක් හෝ හිතාමතා පැහැරහැරීමක් සිදුකර නොමැති බවට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 164 වන වගන්තිය සංශෝධනය කිරීම.

**50.** ප්‍රධාන ප්‍රඥප්තියේ 164 වන වගන්තියේ "එක් එක් තැනැත්තාට තක්සේරුකරු", යන වචන වෙනුවට "එක් එක් තැනැත්තාට සහ එක් එක් හවුල් ව්‍යාපාරයට තක්සේරුකරු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 208 වන වගන්තිය සංශෝධනය කිරීම.

**51.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 208 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ" යන වචනවල සිට ඒ උපවගන්තියේ අග දක්වා වූ වචන වෙනුවට :—

"කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමතය නොමැතිව, දේශීය

ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු හෝ දේශීය ආදායම් තක්සේරුකරුවකු විසින්—

(අ) 163 වන වගන්තිය යටතේ ක්‍රියාකිරීම ; හෝ

(ආ) 165 වන වගන්තියේ (7) වන උපවගන්තිය පරිදි එකඟතාවයට පැමිණීම හෝ කරන ලද තක්සේරුවකට වෙනසක් කිරීම,

නොකළ යුතු ය." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**52.** 2007 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තියේ "කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන යෙදුමේ අර්ථකථනයේ "අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට", යන වචන වෙනුවට "අර්ථසාධක අරමුදලක්, පාරිතෝෂික අරමුදලක් හෝ විශ්‍රාම වැටුප් අරමුදලක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කිරීම.

**53.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ 7 වන අයිතමය වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

"7 ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ සමිතියක් ලෙස ලියාපදිංචි කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන ලියාපදිංචි සමිතියක්,

2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන හෝ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම මත සියයට 5".

**54.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයේ 15 වන අයිතමේ "සහ ශ්‍රී ලංකාවට බැහැරින් ලැබී ඇති ", යන වචන වෙනුවට "සහ 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර ශ්‍රී ලංකාවට බැහැරින් ලැබී ඇති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

අතීතයට බලපෑම.

**55.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (උෟ) ඡේදයට, 23 වන වගන්තියේ (1) වන උපවගන්තියට, 26 වන වගන්තියට, 62 වන වගන්තියට, 107 වන වගන්තියට, සහ 163 වන වගන්තියට අනුපිළිවෙලින් මේ පනතේ 3(1) (ඈ) වගන්තියෙන්, 15 (1) (අ) වගන්තියෙන්, 19 වන වගන්තියෙන්, 29 වන වගන්තියෙන්, 35 වන වගන්තියෙන් සහ 49 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, සියලු කාර්යයන් සඳහා 2006 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක භාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 20 (3) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (3) වන උපවගන්තියට (ඉ) ඡේදය එකතු කිරීමෙන් කරන ලද සංශෝධනය, සියලු කාර්යයන් සඳහා 2007 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක භාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ, අනුපිළිවෙලින් 21 (1) (අ) වගන්තියෙන් සහ 47 වන වගන්තියෙන් 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට කරන ලද සංශෝධනය හා ඇතුළත් කරනු ලැබූ XXඅ අලුත් පරිච්ඡේදය, සියලු කාර්යයන් සඳහා 2008 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක භාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(4) මෙම වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල නිශ්චිතව සඳහන් කර ඇති සංශෝධන හැර, ප්‍රධාන ප්‍රඥප්තියට මෙම පනතින් කරන ලද අනිකුත් සියලුම සංශෝධන 2008 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**56.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.